ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය - 2024

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මධ්‍යස්ථානය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මධ්‍යස්ථානයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදි.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මධ්‍යස්ථානයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන්වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි,පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මධ්‍යස්ථානය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම්කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් මධ්‍යස්ථානය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 2 “මුදල් ප්‍රවාහ ප්‍රකාශන” හි 27 (ආ) ඡේදය ප්‍රකාරව ජංගම වත්කම්වල අඩුවීම ආයෝජිත හෝ මුදල් ප්‍රවාහයන් මූල්‍යනය සම්බන්ධිත වියදම් අයිතමයක් වුවද Prepayment and Advance ගිණුමෙහි රු.2,499,000කින් ශේෂය අඩුවීම ව්‍යාපාරයෙන් මුදල් ගලා යාමක් ලෙස සලකා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර තිබුණි.	2025 වසරේදී අදාළ නිවැරදි කිරීම සිදු කිරීමට කටයුතු කරන බව.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය.

1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) තොග ලේඛනයේ සටහන්වී නොතිබුණු රු. 2,528,544ක් වටිනා අත්පත්‍රිකා හා දැන්වීම් තොගයට ඇතුලත් කර තිබීම නිසා මූල්‍ය ප්‍රකාශනවල තොගයේ වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.	2025 වසරේදී නිසි පරිදි ගැලපීම් සිදු කිරීමට කටයුතු කරන බව.	මූල්‍ය ප්‍රකාශනයේ තොග වටිනාකම නිවැරදිව දැක්විය යුතුය.
(ආ) කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට අයත් භූමියක 2010 වර්ෂයේදී රු.මිලියන 1,034.39ක් වැය කර ඉදි කරන ලද ගොඩනැගිල්ලේ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල හඳුනා නොගැනීම නිසා එම වටිනාකමින් ජංගම නොවන වත්කම් අඩුවෙන් දක්වා තිබුණි.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව මූල්‍ය ප්‍රකාශනවල ගොඩනැගිල්ලේ වටිනාකම ඇතුලත් කිරීමට නොහැකි වී තිබෙන්නේ එහි අයිතිය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සතුව නොමැති නිසා බව.	ගොඩනැගිලලේ අයිතිය මධ්‍යස්ථානයට පවරා ගැනීමටත් මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් කරගැනීමටත් කටයුතු කල යුතුය.

1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්
1.6.1 ලැබිය යුතු මුදල්

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 05හි අනෙකුත් ලැබීම් යටතේ 2023 වර්ෂයේ සිට නිළධාරියෙකුගෙන් අයවීමට ඇති රු.426,000ක මුදල අය කර ගැනීමට සමාලෝචිත වර්ෂයේ දී කටයුතු කර නොතිබුණි.	අදාල නිලධාරියාගෙන් අයකර ගැනීම සඳහා නීතිමය පියවර ගැනීමට කටයුතු කරමින් පවතින බව.	අයවිය යුතු මුදල කඩිනමින් අය කර ගැනීමට කටයුතු කල යුතුය.

1.6.2 අත්තිකාරම්

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
කොන්ත්‍රාත්තුවක ඇස්තමේන්තුව හා සැලැස්ම අදාල අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කරන තුරු ඒ වෙනුවෙන් වියදම් නොදැරිය යුතු වුවත් අනුමත කිරීමට පෙර අවිත්තාව මාර්ගයේ ඉහල කන්ද මංසන්ධියෙන් ඉහළට ඔසවා සකස් කිරීමේ කොන්ත්‍රාත්තුව ආරම්භ කිරිම සඳහා සියයට 20ක බල ගැන්වීමේ අත්තිකාරම් මුදලක් ලෙස රු.4,035,656ක් ගෙවා තිබුණි.	මාර්ග සංවර්ධන අධිකාරියේ ඉල්ලීම මත සියයට 20ක අත්තිකාරම් ගෙවා ඇති බවත් රාජ්‍ය ආයතන දෙකක් අතර නිසා සුරක්ෂණයක් ලබා නොගන්නා බවත් සඳහන් කර ඇති බව.	අත්තිකාරම් ලබා දීමට පෙර අවශ්‍ය අනුමැතීන් ලබා ගත යුතුය.

1.6.3 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ			
	(i) මුදල් රෙගුලාසි 137	සේවාවන් වැඩ හෝ සැපයුම් සම්පූර්ණ කළ විටක මුදල් රෙගුලාසියේ (1) (2) (3) හි සඳහන් කරුණු සත්‍යාපනය කිරීමෙන් පසු ගෙවීම් අනුමත කල යුතු වුවත් ඉහළ කන්ද මංසන්ධිය ඉහළට ඔසවා සකස් කිරීමේ ව්‍යාපෘතියේ සියයට 70ක වැඩ පමණක් අවසන් කර තිබියදී රු.19,414,589ක මුදලක් පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට ලබා දී තිබුණි.	2024.12.31 වන විට ව්‍යාපෘතියෙන් සියයට 75ක් අවසන් කර කොටස් ගෙවීමක් ලබාගැනීම සඳහා ඉදිරිපත් කරන ලද නමුත් අත්තිකාරම් මුදල හැර වෙනත් ගෙවීමක් සිදු කර නොමැති බව.	මුදල් රෙගුලාසි සංග්‍රහයේ විධි විධාන පරිදි කරුණු සත්‍යාපනය කිරීමෙන් පසු ගෙවීම් අනුමත කල යුතුය.
	(ii) මුදල් රෙගුලාසි 101 සහ 156 (1)	බඳවා ගැනීමේ අවම සුදුසුකම් නොමැති අධ්‍යක්ෂ (අවමකිරීම්) තනතුරට පත් කර තිබූ වසර 03ක පරිවාස කාලයක්ද සේවය නොකර එක් වර්ෂයක කාලයකින් පසු සේවය ස්ථිර කර තිබූ නිලධාරිනිය වෙත 2014 වර්ෂයේ සිට රු. මිලියන 14.16ක් වැටුප් හා දීමනා ලෙස ගෙවීම් කර තිබුණද, මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	අදාළ ගොනුවන්හි ඇති තොරතුරු අනුව අධ්‍යක්ෂ (අවම කිරීම්) තනතුර සඳහා ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් මඟින් අයදුම්පත් කැඳවා බාහිර අයදුම්කරුවෙකු වශයෙන් මෙම නිලධාරිණිය බඳවාගෙන ඇති බව.	මුදල් රෙගුලාසි සංග්‍රහයේ විධි විධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.
	(iii) මුදල් රෙගුලාසි 371 (5) සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	අතුරු අග්‍රිමයක් නිකුත් කිරීමෙන් පසු අදාල කාර්යය අවසන් කර දින 10ක් ඇතුළත එම අතුරු අග්‍රිමය පියවිය යුතු වුවත් ලබා දී තිබූ එකතුව රු.926,250ක අතුරු අග්‍රිම 14ක් එසේ පියවීමට කටයුතු කර නොතිබුණි.	මෙම ප්‍රමාදයන් වළක්වා ගැනීම සඳහා සියලුම දිස්ත්‍රික් ඒකක වෙත නැවතත් ලිපියක් නිකුත් කිරීමට කටයුතු කරන බව.	අතුරු අග්‍රිම පියවීම මුදල් රෙගුලාසි සංග්‍රහයේ විධි විධාන ප්‍රකාරව සිදු කල යුතුය.
(ආ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ මෙහෙයුම් අත්පොතේ 6.6 ඡේදය	2024 වර්ෂයේ මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද කෙටුම්පත් වාර්ෂික වාර්තාව මාර්ගෝපදේශයේ මගපෙන්වීම් ප්‍රකාරව පිළියෙල කර නොතිබුණි.	2024 වාර්ෂික වාර්තාව මාර්ගෝපදේශයේ කරුණුවලට යටත්ව සකස් කර වාර්තාවේ කෙටුම්පත නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා අංශ ප්‍රධානීන් වෙත යොමු කර ඇත.	මාර්ගෝපදේශයේ මගපෙන්වීම් ප්‍රකාරව වාර්ෂික වාර්තාව පිළියෙල කල යුතුය.

(ඇ)	2021 සැප්තැම්බර් 29 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 2.3 (i) ඡේදය	ගම්පහ දිස්ත්‍රික්කයේ එකතුව රු.2,604,100ක් පිරිවැය වූ ව්‍යාපෘති 03ක් ප්‍රජා පාදක සමිතිවල ප්‍රමාණවත් බැංකු ශේෂයන් නොතිබියදී කොන්ත්‍රාත් පිරිනමා තිබුණි.	ඉදිරියේ ක්‍රියාත්මක කරන සියලුම ව්‍යාපෘති සඳහා වෙන වෙනම මූල්‍ය වත්කම් සොයා බැලීමට ප්‍රාදේශීය ලේකම් විසින් එකඟ වී ඇති බව.	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය.
(ඈ)	2005 අංක 13 දරණ ව්‍යසන කළමනාකරණ පනත	2013න් පසු ජාතික ව්‍යසන කළමනාකරණ සභාව පවත්වා නොතිබුණි	මේ පිළිබඳව ඉහල නිලධාරීන් දැනුවත් කිරීමට පියවර ගන්නා බව.	ව්‍යසන කළමනාකරණ සභාව පැවැත්වීමට කටයුතු කල යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 102.73ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.මිලියන 11.54ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 91.19ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට පරිපාලන හා මෙහෙයුම් වියදම් රු.මිලියන 30.58කින්ද වෙනත් වියදම් රු.මිලියන 76.9කින් සහ ප්‍රග්ධන ප්‍රදාන යටතේ සේවක පුහුණු හා උපකරණ අත්කර ගැනීමේ වියදම් රු.මිලියන 44.29කින්ද වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.2. ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව පුනරාවර්තන ප්‍රදාන සියයට 34කින් පමණ වැඩි වී තිබුණද, පුනරාවර්තන වියදම සියයට 1,689කින් වැඩි වී තිබුණි. මේ සඳහා බලපෑ ප්‍රධාන හේතුව, පෙර වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රදාන සැලකිය යුතු ප්‍රමාණයක් භාවිතයට නොගෙන ඒවා නිසා ප්‍රවර්තන වර්ෂයේ භාවිතයට ගැනීමයි. ඒ අනුව ප්‍රවර්තන වර්ෂයේ භාවිතයට නොගෙන ඉතිරි ප්‍රග්ධන ප්‍රදාන මත වූ උපකරණ අත්කර ගැනීමේ වටිනාකම රු. මිලියන 37ක් විය.

2.3 ඉකුත් වසරට සාපේක්ෂව ජංගම අනුපාතය 1.01කින් වැඩි වී තිබුණි. මෙම අඩුවීමට ප්‍රධානම හේතුව ආපදා ප්‍රතිචාර දැක්වීමේ උපකරණ තොගයක් රඳවා ගෙන තිබීම විය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත සංශෝධනය කරන තුරු 2012 ජූලි 05 දින අංක අමප/12/0790/548/004 දරන අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව අන්තර් කාලීන කළමනාකරණ කමිටුව ස්ථාපිත කිරීම සඳහා අනුමැතිය ලබා දී තිබුණි. නමුත් වසර 12කට වැඩි කාලයක් ගත වී ඇතත් ශ්‍රී ලංකා ව්‍යසන	මෙම කර්තව්‍ය අමාත්‍යාංශයේ කළමනාකරණ අංශය විසින් සිදුකරන බැවින් ඒ පිළිබඳව කළමනාකරණ අංශය දැනුවත් කිරීමට කටයුතු කරන බව.	පනතෙහි සංශෝධන සිදු කර පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගැනීමට කඩිනමින් කටයුතු කල යුතුය.

	කළමනාකරණ පනතේ අවශ්‍ය සංශෝධන කටයුතු සිදු කර නොතිබුණි.		
(ආ)	උක්ත පනතේ 04 වගන්තිය අනුව සෑම දිස්ත්‍රික්කයකටම මෙහෙයුම් සැලැස්මක් සකස් කළ යුතු නමුත්, දිස්ත්‍රික්ක 7ක සැලසුම් සකස් කිරීමේ කටයුතු සිදු කර නොතිබුණි. තවද ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම කෙටුම්පත් කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.	ADPC ආයතනය මඟින් ලබාදුන් මූල්‍ය ප්‍රතිපාදන මත 2017 වර්ෂයේදී දිස්ත්‍රික් මෙහෙයුම් සැලසුම් 18ක් පමණක් මුද්‍රණය කරන ලද අතර මේ වනවිට එම දිස්ත්‍රික් මෙහෙයුම් සැලැසුම් යාවත්කාලීන කරමින් පවතින බව.	පනතේ 04 වගන්තිය අනුව ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම කඩිනමින් සකස් කර අමාත්‍ය මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කල යුතුය.
(ඇ)	ආපදා අවදානම් අවම කිරීමේ ව්‍යාපෘති සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත 2024 ජනවාරි 31 දින ලබා දී ඇති අනුගමනය කළයුතු පොදු උපදෙස් මාලාවේ ඇමුණුම 01හි 2 (ii) ප්‍රකාරව මහජන විරෝධය අවම වන ආකාරයට ව්‍යාපෘතිය තෝරා නොගැනීම නිසා ඇස්තමේන්තු වටිනාකම රු.2,961,504ක් වූ කෑගල්ල දිස්ත්‍රික්කයේ දෙහිඕවිට, තලපිටිය මැදිකැලේ මාර්ගය ආශ්‍රිතව පවතින ගල් පෙරළීමේ අවදානම ඉවත් කිරීමේ ව්‍යාපෘතිය අඩක් නිම කිරීමෙන් පසු ප්‍රදේශවාසීන්ගේ විරෝධය මත අතරමඟ නවතා දමා තිබුණි. අඩක් නිමකිරීම නිසා ආපදා අවදානම ඉහල ගොස් තිබූ අතර, අපේක්ෂිත අරමුණට ලඟා වීමට නොහැකි වී තිබුණි.	දෙහිඕවිට, තලපිටිය, මැදි කැලේ මාර්ගය ආශ්‍රිතව පවතින ගල් පෙරළීමේ අවදානම ඉවත් කිරීමේ ව්‍යාපෘතියෙහි නාය යාමේ අවදානම් සංඥා පුවරුවක් සවිකොට ඇති අතර, ඉඩම් පරිහරණ ශිල්පීය උපදෙස් ලබාගැනීම සඳහා ඉඩම් පරිහරණ නිළධාරි වෙත යොමු කර ඇත. ඉඩම් පරිහරණ නිළධාරී වාර්තාව අනුව ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිත බව.	පොදු උපදෙස් මාලාව අනුගමනය කිරීම අනිවාර්ය කර ආපදා අවම කිරීමේ ව්‍යාපෘති තුළින් අපේක්ෂිත ප්‍රතිඵල ලඟා කර ගැනීමට මධ්‍යස්ථානය කඩිනමින් කටයුතු කල යුතුය.
(ඈ)	ග්‍රාම නිලධාරි වසම් කිහිපයකට බලපාන ගංවතුර තත්ත්වය මඟහරවා ගැනීමට ඇස්තමේන්තු පිරිවැය රු.මිලියන 3ක් වූ තිසා වැවේ සිට ගල්කඩවල වැවට ජලය රැගෙන යන කරඹැව යෝධ ඇළ කි.මී 8 ක් ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සමාලෝචිත වර්ෂයේ දී කටයුතු කර නොතිබුණි.	මහා භාණ්ඩාගාරය විසින් 2024 වර්ෂය සඳහා ප්‍රතිපාදන ලබා දී තිබුණේ රු.මිලියන 200ක් බැවින් සිදු කිරීමට නොහැකි වූ බව	සැලසුම් කල පරිදි ප්‍රමුඛතාවය ලබා දිය යුතු ව්‍යාපෘති ක්‍රියාත්මක කර අපේක්ෂිත ප්‍රතිඵල ලඟා කර ගැනීමට කටයුතු කල යුතුය.
(ඉ)	දිස්ත්‍රික්ක 12 ක පිහිටි පළාත් පාලන ආයතන 134ක ප්‍රාදේශීය ආපදා අවදානම් අවම කිරීමේ සැලසුම් සකස් කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන රු.මිලියන 40ක ප්‍රතිපාදන භාණ්ඩාගාරය හරහා සපයා තිබුණද ව්‍යාපෘතිය අවසන් වනවිට සකස්	ව්‍යාපෘතියේ සැලසුම අනුව ව්‍යාපෘතිය ආසන්න වශයෙන් කාලය මාස 10ක් සඳහා විය. රට තුළ තිබූ අර්බුදකාරී වාතාවරණය අනුව භාණ්ඩ හා සේවා මිල අධික වීම හේතුවෙන්	සැලසුම් කල පරිදි ව්‍යාපෘති ක්‍රියාත්මක කර අපේක්ෂිත ප්‍රතිඵල ලඟා කර ගැනීමට කටයුතු කල යුතුය.

කර තිබුණේ සැලසුම් 32ක් පමණි. අනුමත අයවැය තුල පළාත් නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාල 4ක් පිහිටුවීම සඳහා රු.මිලියන 4ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද අවශ්‍ය පසුබිම නිර්මාණය කිරීමට අපොහොසත්වීම මත එම මුදලින් රු.4,109,000ක ලැප්ටොප් පරිගණක 10ක් මිලදී ගැනීම හා කොන්ත්‍රාත් පදනම මත කාර්ය මණ්ඩලය බඳවා ගැනීම වෙනුවට මධ්‍යස්ථානයේ ස්ථිර කාර්ය මණ්ඩලයට රු.128,134ක් ගෙවීම් කිරීම වැනි දුර්වල කළමනාකරණ තීරණ හේතුවෙන් ප්‍රතිපාදන ලැබී තිබියදී ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රගතිය කරා ලගා වීමට නොහැකි වී තිබුණි.	සැලසුම් කළ ආයතන 134 වෙනුවට එය 77 දක්වා අඩු කිරීමට සිදුවිය. මැතිවරණය දින නියමයකින් තොරව කල් දැමීම මත ව්‍යාපෘතියේ කටයුතු ද දින නියමයකින් තොරව කල් දැමීමට සිදුවිය. ඒ අනුව සැලසුම් කළ පරිදි ව්‍යාපෘතිය නිම කිරීමට ප්‍රමාණවත් කාලයක් නොලැබීම නිසා සැලසුම් 32ක් පමණක් සකස් කිරීම සිදු කල බව.	

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මධ්‍යස්ථානය ආරම්භ කර 2011 වසරේ සිට 2024 දක්වා කාලය තුල දී රු.මිලියන 3,404.95ක් ආපදා අවම කිරීමේ ව්‍යාපෘති සඳහා වියදම් කර තිබුණි. එසේ වුවද ප්‍රධාන ආපදාවන් ලෙස හඳුනා ගත හැකි ගංවතුර, නායයාම් හා වැඩි සුළං යන තත්ත්වයන් වලදී නායයාම් තත්ත්වය හැරුණු විට අනෙකුත් තත්ත්වයන් දෙක යටතේ 2022 සිට 2024 කාලය තුල පීඩාවට පත්වූ සංඛ්‍යාව ආසන්න වශයෙන් පස් ගුණයකින් පමණ වැඩි වී ඇත.	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට වසර 13ක් තුල ලැබී ඇති ආපදා අවම කිරීමේ ප්‍රතිපාදන තුලින් පමණක් ආපදාවන්ගෙන් පීඩාවට පත්වන පුද්ගල සංඛ්‍යාව අඩුකල නොහැකි බව	ජාතික ආපදා සැලැස්ම සකස් කර දැඩි අවදානම් සඳහා ප්‍රමුඛත්වය දී ඒ අනුව ආපදා අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතුය.

3.3 අරමුදල් ඌන උපයෝජනය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ 8 (2) (1) (අ) සිට (ඇ) වගන්ති ප්‍රකාරව අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ රාජ්‍ය සංස්ථා සමඟ සම්බන්ධීකරණයෙන් වැඩසටහන් සහ සැලසුම් පිළියෙල කිරීම සහ ක්‍රියාත්මක කිරීම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කාර්යයක් වුවත් සමාලෝචිත වර්ෂයේදී වෙනත් රාජ්‍ය ආයතන විසින් ව්‍යාපෘති 03ක් සඳහා ප්‍රතිපාදන වෙන් කර, ක්‍රියාත්මක කර තිබියදී එම ව්‍යාපෘති සඳහා මධ්‍යස්ථානයද දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත රු. මිලියන	අනුමත වර්ෂයට පෙර වර්ෂයේදී ව්‍යාපෘති ලබා ගන්නා අතර ව්‍යාපෘති තේරීමද පෙර වර්ෂයේම සිදුකරයි. පසුව ඇතිවන විවිධ හේතූන් මත සහ හදිසි ආපදා තත්ත්ව යටතේ වෙනත් ආයතන මඟින් ද ව්‍යාපෘති ක්‍රියාත්මක වීම හේතුවෙන් එම ව්‍යාපෘති අවලංගු කොට ප්‍රතිපාදන නැවත පවරාගෙන ඇති බව.	ව්‍යාපෘති තෝරා ගැනීමේදී අනෙකුත් ආයතන සමඟ සම්බන්ධීකරණයක් සිදු කළ යුතුය.

	3.98ක ප්‍රතිපාදන යවා නැවත පවරා ගෙන තිබුණි. මේ හේතුවෙන් වෙනත් ව්‍යාපෘතියක් සිදු කිරීමට තිබූ අවස්ථා මගහැරී තිබුණි.		
(ආ)	අනුරාධපුර දිස්ත්‍රික්කයේ අශෝකමාලා සපත්තු පාලම වර්ෂා තත්ත්වයන් සමඟ සම්පූර්ණයෙන්ම හානි වී ඇල මතට පෙරලී තිබීම නිසා පිරිවැය රු.5,121,768ක සංශෝධිත ඇස්තමේන්තුවක් අනුමත කර, අත්මුදල් ලබා දී තිබුණද, නියමිත කාලය තුල වැඩ ආරම්භ කිරීමට කටයුතු නොකර වෙන් කළ ප්‍රතිපාදන මාස 4කට ආසන්න කාලයක් රඳවා තබා ගෙන නැවත මධ්‍යස්ථානය වෙත එවා තිබුණි. ඒ හේතුවෙන් ආපදා අවදානම වැඩි වී ඇති අතර වෙනත් ව්‍යාපෘති කාර්යයන් සඳහා ප්‍රතිපාදන යෙදවීමට තිබූ අවස්ථාවද අහිමි කර තිබුණි.	මෙම තත්ත්වය ඇති වීමට ප්‍රධානතම හේතුව ආපදා කළමනාකරණයෙන් පරිබාහිර වෙනත් සංවර්ධන කටයුතු සිදු කිරීම සහ පවත්නා ආපදා අවදානම අඩු කිරීම හා නව ආපදා අවදානම් ඇති වීම වැළැක්වීමට කටයුතු නොකිරීම බව.	ප්‍රතිපාදන ලබා දීමෙන් පසු එම ව්‍යාපෘතිවල ක්‍රියාත්මකවීම පිළිබඳව දැඩි අධීක්ෂණයක් හා පසු විපරමක් මධ්‍යස්ථානය විසින් සිදු කළ යුතුය.

3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ආපදා අවම කිරීමේ අංශය විසින් පසුගිය වසර 13ක කාලය තුල රු.මිලියන 278.59ක් වැය කර ක්‍රියාත්මක කර තිබූ ඉදිකිරීම් ව්‍යාපෘති 10ක් අසාර්ථක වී, ඌන උපයෝජිතව පවතින බව විගණනයේදි නිරීක්ෂණය විය.	ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති ඌණ උපයෝජිතව නොමැති අතර ව්‍යාපෘතිවල වැඩ අවසන් කිරීමේ වාර්ථා මඟින් භාවිතය සම්බන්ධයෙන් තහවුරු කොට ඇත	ආපදා අවම කිරීමේ ව්‍යාපෘති නියම කාල වකවානු තුල සිදු කිරීමෙන් අපේක්ෂිත ප්‍රතිඵල ලඟා කර ගැනීමට කටයුතු කල යුතුය.
(ආ)	පානීය ජල ව්‍යාපෘතිය යටතේ රු.640,947ක පිරිවැයකට පලාගල බුදුගේහින්න ග්‍රාම නිලධාරි වසමේ පල්ලකැලේ ඉදිකර තිබූ ළිඳ, ඉදිකර ඇති ඉඩම වනරක්ෂිතයකට අයත් බැවින් විදුලි සම්බන්ධතාවය ලබා ගැනීමට නොහැකිවීමෙන් භාවිතයට ගත නොහැකි වී තිබුණි.	මෙම ඉඩම් කොටස වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් බැවින් විදුලි සැපයුම ලබා ගැනීම සඳහා අනුමැතිය ඉල්ලා ඇති බවත්, අනුමැතිය ලැබූ පසු විදුලිය ලබාගෙන ඉදිරි කටයුතු සිදුකරන බවත් දන්වා ඇති බව	ඉදි කිරීම් ආරම්භ කිරීමට ප්‍රථම භූමියේ හිමිකාරිත්වය සහ නීත්‍යානුකූලභාවය පරීක්ෂා කල යුතුය.

3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශ
(අ)	මධ්‍යස්ථානය පිහිටි ගොඩනැගිල්ලේ සිදුකල රු.1,075,800ක් වූ අත්‍යාවශ්‍ය අළුත්වැඩියා හා නඩත්තු කටයුතු සම්බන්ධයෙන් ප්‍රසම්පාදනයේදී කිසිදු සම්මත ලංසු ලේඛනයක් භාවිතා කර නොතිබුණි.	ආයතනික අවශ්‍යතාවය මත පදනම්ව ප්‍රසම්පාදනය සිදු කර ඇති අතර නියමිත ලංසු ලේඛණ පිළියෙල කිරීමක් සිදු කර නොමැති බව	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කල යුතුය.
(ආ)	ප්‍රසම්පාදන කටයුත්ත සඳහා ප්‍රතිපාදන මුදල් පවතින බවට සහතික වීම ප්‍රසම්පාදන කමිටුවේ වගකීමක් වුවත් මධ්‍යස්ථානයේ ගොඩනැගිල්ලේ නඩත්තු කටයුතු ප්‍රසම්පාදනයේදී රු.400,000ක අරමුදල් ඌනතාවයක් සහිතව ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර තිබුණි.	කාලයක සිට පැවති අත්‍යාවශ්‍යතාව අනුව, මෙම කටයුත්ත සිදු කිරීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා වත්කම් අත්පත් කර ගැනීම් හා ප්‍රතිෂ්ඨාපනය සඳහා සෘජුවම වෙන්ව තිබූ රු.මි.6.4 ක ප්‍රතිපාදන මඟින් සහ ආපදා කළමනාකරණ අංශය මඟින් රු.ලක්ෂ 6ක මුදලක් ලබා දීමේ වාචික එකඟතාවය මත ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර තිබේ.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කල යුතුය.
(ඇ)	ප්‍රතිවෛරස් මෘදුකාංග පද්ධතිය යාවත්කාලීන කිරීමේ ප්‍රසම්පාදනය සඳහා පත්කල ප්‍රසම්පාදන කමිටු සහ තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයින් විසින් ප්‍රකාශයක් ලබා දීමට කටයුතු කළ යුතු වුවත් එසේ සිදු කර නොතිබුණි.	ඉදිරියේදී කමිටු සමාජිකයින් සහ සහය වන නිළධාරීන්ගෙන් අදාළ ප්‍රකාශයක් ලබා ගැනීමට කටයුතු කරන බව.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කල යුතුය.
(ඈ)	ගලේවෙල ප්‍රාදේශීය සභාව සහ ඒ අවට පොදු භූමියට සිදුවන ගංවතුර හානිය වළක්වා ගැනීමේ ව්‍යාපෘතිය නමින් ඇස්තමේන්තු පිරිවැය වූ රු.43,297,181ක් වැය කර ගලේවෙල මහජන ක්‍රීඩාංගනය හා ප්‍රේක්ෂකාගාරය අලුත්වැඩියා කර තිබුණි. ආපදා සඳහා ප්‍රතිචාර දැක්වීමේ සුරක්ෂිත / සහන මධ්‍යස්ථානයක් ලෙස අළුත්වැඩියා සිදු කල ද, ඊට අවශ්‍ය කිසිදු පහසුකම් එහි නොතිබුණි. මෙහිදී රු.2,032,633ක් වැය කර මිලදී ගෙන තිබූ යන්ත්‍ර හා උපකරණ වලින් නැවත භාවිතා කළ හැකි රු.1,316,948ක් වටිනා යන්ත්‍ර හා උපකරණ ගලේවෙල ප්‍රාදේශීය සභාවට හෝ ආපදා කළමනාකරණ දිස්ත්‍රික් ඒකකයට භාර දී නොතිබුණි. තවද මෙම ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණ බව තවදුරටත් නිරීක්ෂණය විය.	අදහස් දක්වා නොතිබුණි.	ආපදා අවම කිරීම සඳහා වෙන් කල ප්‍රතිපාදන මුදල් ඵලදායි ලෙස ප්‍රසම්පාදන කටයුතු සිදු කර අපේක්ෂිත අරමුණ ලගා කර ගැනීම සඳහා මධ්‍යස්ථානය විසින් නිසි අධීක්ෂණයක් සිදු කල යුතුය.

(ඉ)	2009 වර්ෂයේ දී ස්ථාපිත කරන ලද සුනාමි හා සුළි සුළං පිළිබඳ පූර්ව දැනුම්දීමේ කුළුනු 77ක් 2016 වර්ෂයේ දී පෞද්ගලික සමාගමක් විසින් රු.මිලියන 134.7ක ඇස්තමේන්තු වටිනාකමකට අලුත්වැඩියා කිරීමට කොන්ත්‍රාත්තුවක් දී තිබුණද ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමේදී හා ක්‍රියාත්මක කිරීමේදී එළඹ තිබූ ගිවිසුමට පටහැනිව කටයුතු කිරීම නිසා සමාලෝචිත වර්ෂය වන විට කුළුනු කිසිවක් ක්‍රියාත්මක තත්ත්වයේ නොපැවතුණි.	සුනාමි සහ සුළි සුළං තත්ත්වයන් සඳහා පූර්ව අනතුරු ඇඟවීමේ ක්‍රමවේදයක් ලෙස කුළුණු 77ක් 2019 වර්ෂයේ දිස්ත්‍රික් 14ක් තුළ ස්ථාපිත කර ඇත. 2016 වර්ෂය වන විට කුළුණුවල ක්‍රියාකාරිත්වය අවම මට්ටමක පැවතීම හේතුවෙන් කුළුණු අලුත්වැඩියා කර නඩත්තු කටයුතු කිරීම සඳහා නව ගිවිසුමක් ගිවිසගෙන ඇත.	ගිවිසුම ප්‍රකාරව කටයුතු කල යුතුය.

3.6 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ඇස්තමේන්තු පිරිවැය රු.මිලියන 10ක් වූ දෙපස පැති බැම් පමණක් සකස් කල යුතුව තිබූ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ 7 කණුව සිට කොටිකාපිටිය යන මාර්ගයේ අලි අඩි ඔඩය හරහා ඇති කොන්ක්‍රීට් පාලම සකස් කිරීමේ ව්‍යාපෘතිය නියමිත කාලයේදී සිදු නොකිරීම නිසා ඇදහැලුනු අධික වර්ෂාවත් සමඟ පාලම සම්පූර්ණයෙන් කඩාවැටීම නිසා පූර්ණ වශයෙන් ඉදි කිරීමට සිදු වී තිබුණි.	දිස්ත්‍රික් ලේකම් වරුන්ගේ ප්‍රමුඛතාවය අනුව ප්‍රතිපාදන වෙන් කරනු ලබන අතර, වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් නඩත්තු වන මෙම පාළම සඳහා ප්‍රතිපාදන වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ වෙන්ව තිබී නොමැත. එහෙත් ආපදා කළමනාකරණ විෂය යටතේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් ප්‍රතිපාදන වෙන් කිරීම නිසා ඉතිරි ප්‍රතිපාදන වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් යොදවා ව්‍යාපෘතිය පූර්ණ ලෙස ඉටු කිරීමට එකඟ වී ඇත. ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙමින් පවතී.	කාලීනව ව්‍යාපෘති ඉටුකර ගැනීම සඳහා කොන්ත්‍රාත් පරිපාලනය නිසි පරිදි කල යුතුය.

3.7 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 දෙසැම්බර් 31 දිනට මධ්‍යස්ථානයේ අනුමත කාර්ය මණ්ඩල නිලධාරීන් 477ක් වුවද සේවයේ නියුතු කාර්ය මණ්ඩලය 269ක් වූ බැවින් පුරප්පාඩු 178ක් විය. මෙම පුරප්පාඩුවලින් සහකාර අධ්‍යක්ෂ (මානව සම්පත් සහ පරිපාලන) සහ පරිපාලන නිලධාරි තනතුරු පුරප්පාඩු වසර ගණනාවක සිට පිරවීමට කටයුතු කර නොතිබීම මධ්‍යස්ථානයේ කටයුතු පවත්වා ගෙන යාම කෙරෙහි අහිතකර ලෙස බලපා තිබුණි.	අංක 21/1596/304/134 දරණ 2021.08.31 දිනැති අමාත්‍ය මණ්ඩල කාර්යාලය මඟින් යොමු කර ඇති අමාත්‍ය මණ්ඩල තීරණය මත බඳවා ගැනීම් සිදු කිරීම නතර කිරීම හේතුවෙන් මෙම සියළු පුරප්පාඩු ඇති විය.	අත්‍යාවශ්‍ය පුරප්පාඩු කඩිනමින් පිරවීමට අවශ්‍ය අනුමැතින් ලබා ගැනීමට කටයුතු කල යුතුය.

(ආ) මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂ (මෙහෙයුම්) සහ දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂ යන තනතුරු සඳහා අනුමත බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් සුදුසුකම් සහ පළපුරුද්ද සහිත නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර අදාල තනතුරු සඳහා හමුදා නිලධාරීන් අනුයුක්ත කර තිබුණි.	අධ්‍යක්ෂ (මෙහෙයුම්) යන තනතුර දරණ නිලධාරී විසින් ව්‍යසනයක්/හදිසි ආපදාවක් සිදු වූ විට ත්‍රිවිධ හමුදාව සම්බන්ධීකරණය කළ යුතුව ඇත. එබැවින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය අධ්‍යක්ෂ (මෙහෙයුම්) තනතුර ආරම්භයේ සිටම ත්‍රිවිධ හමුදා නිලධාරියෙකු අනුයුක්ත කර ගනිමින් පවත්වා ගෙන ගොස් ඇති අතර ඒ සඳහා ව්‍යසන කළමනාකරණය සඳහා ජාතික සභාවේ සහ අන්තර්කාලීන කළමනාකරණ කමිටුවේ අනුමැතිය ලැබී ඇති බව	බඳවා ගැනීමේ පරිපාටියේ අවශ්‍ය සංශෝධනයන් සිදු කර සුදුසුකම් සහ පළපුරුද්ද සහිත නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කල යුතුය.
(ඇ) සමාලෝචිත වර්ෂය තුලදී සහකාර අධ්‍යක්ෂ (අවම කිරීම්) තනතුර සඳහා බඳවාගැනීමේදී අනුමත බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාව පිළිගත් සිවිල් ඉංජිනේරු උපාධිය සහිත පුද්ගලයෙකු බඳවා ගත යුතු වුවද, ඊට පටහැනිව එම සුදුසුකම නොමැති නිලධාරියකු අදාල තනතුර සඳහා බඳවාගෙන තිබුණි.	අයදුම්කරුවන් අතුරින් අයදුම්කරුවන් දෙදෙනෙකු පමණක් සුදුසුකම් සපුරා තිබුණි. ඒ අනුව එම අයදුම්කරුවන් දෙදෙනා අතුරින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී වැඩිම ලකුණු ප්‍රමාණයක් ලබා ගත් අයදුම්කරු තෝරා ගන්නා ලදී. අනුමත බඳවා ගැනීමේ පරිපාටිය අනුව සියළුම සුදුසුකම් සපුරා තිබූ මෙම අයදුම්කරුවන් දෙදෙනාම සිවිල් ඉංජිනේරු විද්‍යාව හදාරා නොතිබුණි.	තනතුරු සඳහා බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් සුදුසුකම් ඇති අය බඳවා ගැනීමට කටයුතු කල යුතුය.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
මධ්‍යස්ථානය විසින් 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2025 අප්‍රේල් 15 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.	2023 වාර්ෂික වාර්තාව අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කළද එහි අඩුපාඩු තිබීම හේතුවෙන් නියමිත දිනයන්වලට වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට නොහැකි වූ අතර එම අඩුපාඩු නිවැරදි කිරීමෙන් පසුව අමාත්‍ය මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කිරීමට සූදානම් කර ඇත.	වාර්ෂික වාර්තාව නියමිත දිනට පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කල යුතුය.